ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වා ගෙන යාම අවශ්‍ය වේ.

1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 49 ඡේදය ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත් වන දේපළ පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් පිරිවැය රු. 7,000,000 ක් වූ මෝටර් වාහනයක් ප්‍රත්‍යාගණනයේදී සැලකිල්ලට ගෙන නොතිබූ අතර ප්‍රමිතයේ 15 ඡේදයට පටහැනිව රු. 20,591,557 ක් වටිනාකම වූ නිරීක්ෂණ උපකරණ (Monitoring Equipment) දේපල පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත නොකර වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	ආයතනය සතුව වාහන 36 ක් පැවති අතර 2024.12.31 දින වනවිට සම්පූර්ණයෙන්ම ක්ෂය කල වාහන 35ක් විය. එම වාහන සියල්ල ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉතිරි වාහනය 2025.12.31 දින සම්පූර්ණයෙන්ම ක්ෂය වීමට නියමිත අතර 2025 වර්ෂයේ එම වාහනය ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇත. මෙම නිරීක්ෂණ උපකරණ නායයෑමක විස්ථාපනය මැනීම සඳහා පොළව විදුම් සිදුකර පොළව අභ්‍යන්තරයේ තැම්පත් කරණු ලැබේ. මෙමඟින් නායයෑමක පූර්ව අනතුරු නිකුත් කිරීමට අදාල දත්ත ලබා ගැනීම සිදු කරනු	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය.

ලබයි. පොළව අභ්‍යන්තරයේ තැම්පත් කිරීමෙන් පසු මෙම උපකරණ නැවත ඉවතට ගැනීමට හෝ භෞතිකව සත්‍යාපනය කල නොහැක. එබැවින් එම උපකරණ දේපළ පිරියත හා උපකරණ ලෙස වර්ග කළ නොහැකි බව

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ පිරියත උපකරණ වල (ප්‍රදාන හැර) 2024 වර්ෂයට අදාළ ක්ෂය රු. 18,956,312 ක් බදු පෙර ලාභයට ගැලපීම් නොකර බදු පසු ලාභයට පසුව ගළපා ඇති හුවමාරු නොවන ආදායමෙන් (Non Exchange Revenue) අඩු කර දක්වා තිබුණි. ඒ හේතුවෙන් බදු පෙර ලාභය එම වටිනාකමින් වැඩියෙන් පෙන්වා තිබුණි.	2023 වර්ෂයේ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කල අතර එම මුලු ක්ෂය ප්‍රමාණයම පෙර වර්ෂවල මෙහෙයුම් ලාභයට දැනටමත් ගැළපී ඇත.	2024 වර්ෂයට අදාළ සම්පූර්ණ ක්ෂය වටිනාකම බදු පෙර ලාභයෙන් අඩු කළ යුතුය.
(ආ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන වායු විමෝචන භාරකාර අරමුදල විසින් 2023 දෙසැම්බර් 18 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත පවරා දී තිබූ පිරිවැය රු. 30,821,892 ක් වටිනා ජංගම වායු තත්ත්ව මැනීමේ උපකරණය සමාලෝචිත වර්ෂයේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	මෙම ජංගම වායු තත්ත්ව මැනීමේ උපකරණ සවිකර ඇති ලොරි රථයේ අයිතිය 2024.12.31 වන විට මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය වෙත මාරුකර නැත. එබැවින් සංවිධානයේ වත්කමක් ලෙස ගිණුම්ගත නොකරන ලදී.	වත්කම සම්බන්ධයෙන් ගිණුම් වල හෙළිදරව් කර වත්කමේ අයිතිය සංවිධානය වෙත කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැතියන්ගෙන් එකතුව රු. 52,403,142 ක ණය ශේෂයන් අයවිය යුතුව තිබුණි. ඉන් රු. 27,322,941 ක් හෙවත් සියයට 50.21 ක ණය ශේෂ,	මෙම ණය ශේෂයෙන් රුපියල් මිලියන 11.1 ක් ලැබී ඇති අතර රු. මිලියන 20ක ණය ශේෂ අයකර ගැනීමට නොහැකි බැවින් අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුව මඟින් ලබා	කඩිනමින් මෙම මුදල් අයකර ගැනීමට හා නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.

වර්ෂ 3 කට වඩා පැරණි වූ අතර රු. 30,959,296 ක් හෙවත් සියයට 56.89 ක ණය ශේෂ වර්ෂයකට වඩා පැරණි ණය ශේෂ වූ බැවින් මෙම ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	දුන් උපදෙස් අනුව කමිටුවක් පත් කර කපා හැරීමට නිර්දේශ කර ඇති අතර අදාල අනුමැතීන් ලබා ගැනීම සඳහා යොමු කර ඇති බව. .

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 371(2)(ආ)	(i) තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීමේදී කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදීමට ගණන්දීමේ නිලධාරියෙකුට හැකි වුවත් ඊට පටහැනිව අවස්ථා 18කදී රු.488,000 ක් සංවිධානය විසින් මාණ්ඩලික නොවන නිලධාරීන්ට තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස ලබා දී තිබුණි.	පරිපාලනමය සහ අනෙකුත් කටයුතු කර ගැනීමේ පහසුව තකා යම් යම් අවස්ථාවලදී මාණ්ඩලික නොවන නිලධාරීන් හට ද අතුරු අග්‍රිම ලබා දීමට සිදුවන අවස්ථා ඇත. කෙසේ වෙතත් 2024/05/20 දින සිට කණිෂ්ඨ කළමණාකරුවන්ගෙන් පහළ සේවකයින් සඳහා අත්තිකාරම් ලබා දීම නවතා ඇත	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
		(ii) තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාගන්නා නිලධාරීන් විසින් එම කාර්ය නිම කළ විගස අත්තිකාරම් පියවිය යුතු වුවත් අවස්ථා 40 කදී එලෙස ලබාගෙන තිබූ රු. 1,713,050ක අත්තිකාරම් පියවීම සඳහා දින 34 සිට දින 93 ක කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.	වැඩබිම් බොහොමයක් ප්‍රධාන කාර්යාලයෙන් දුර බැහැර ඇති අතර මසකට අධික කාලයක් වැඩබිම් ක්‍රියාත්මක වේ. වැඩබිම්වල කාර්යයන් නිමකර නැවත ප්‍රධාන කාර්යාලයට පැමිණි විගස විශේෂ අත්තිකාරම් පියවීම සිදුවේ. අත්තිකාරම් නොපියවූ නිලධාරීන්හට කෙටි පණිවිඩ යැවීමේ හා අංශ ප්‍රධානී මඟින් දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් ද අදාල නිලධාරීන්ගෙන් කරුණු විමසීමක් සිදුකර එමඟින් මෙම තත්ත්වය අවමකර ගැනීමට පියවර ගෙන ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය

(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදය	සංවිධානයේ සේවකයන් 23 දෙනෙකු විසින් අවස්ථා 29කදී ව්‍යාජ බිල්පත් හා ව්‍යාජ ලෙස නිල මුද්‍රා සකස්කර සමූහ ජීවිත රක්ෂණ හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රු. 1,820,000ක වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.මෙලෙස කූඨ ලේඛන සකස්කර රක්ෂණ වන්දි ලබාගත් නිලධාරීන් හයදෙනෙකු සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ව්‍යාජ ලේඛණ ඉදිරිපත් කර රක්ෂණ මුදල් ලබා ගත් සේවකයින් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව.	කූඨ ලේඛණ සකස් කර රක්ෂණ වන්දි ලබා ගත් නිළධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කඩිනමින්කටයුතු කළ යුතුය.
(ඇ)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදය සහ ඇමුණුම 02 ආකෘතිය	චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මානව සම්පත් සැලැස්මක් සංවිධානය විසින් පිළියෙල කර නොතිබුණි.	සංවිධානයේ පරිපාලන අංශයේ ඉහළ තනතුරු සියල්ලම නිසිපරිදි සම්පූර්ණ වී නොතිබුණු බැවින් මානව සම්පත් සැලැස්ම නිම කිරීමට නොහැකි විය. මේ වනවිට සහකාර අධ්‍යක්ෂ පාලන තනතුර සම්පූර්ණ වී ඇති අතර මානව සම්පත් සැලැස්ම පිළියල කරමින් පවතින බව.	චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මානව සම්පත් සැළැස්ම සකස් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 205,652,593ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 235,379,560 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,726,967ක පසුබෑමක් නිරීක්ෂණය විය. මෙම පසුබෑමට වෙනත් ආදායම් තුළ ඇතුළත් බැංකු පොළී ආදායම රු. 46,698,876කින් පහළ යාම, වැටුප් සහ වේතන රු.96,537,786කින් ඉහළ යාම හා , භාවිතා කරන ලද සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය වියදම රු.80,144,515කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පරිසර අධ්‍යයන හා සේවා, නාය යෑම් පර්යේෂණ සහ අවදානම් කළමණාකරණ, මානව ජනාවාස සැලැසුම් සහ පර්යේෂණ හා ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ, ව්‍යාපෘති කළමනාකරණ, යන අංශ වල ආදායම් 2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේදී පිළිවෙලින් සියයට 29, 23, 9, 27, 124 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වෙනත් ආදායම් සියයට 37 ක පසුබෑමක් නිරීක්ෂණය වූ අතර වැටුප් හා වේතන, සැපයුම් හා පරිභෝජ්‍ය ද්‍රව්‍ය වියදම් පිළිවෙලින් සියයට 27, 39 ක ඉහළ යාමක් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශයට 2021 ඔක්තෝම්බර් 12 දින අනුමැතිය ලැබී තිබුණු අතර පිළියෙල කල පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 26 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණද, එම පනත පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. නැවතත් 2024 ජුලි 17 වන දින අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගෙන, නීති කෙටුම්පත් සම්පාදක විසින් පිළියෙල කරන ලද අවසන් කෙටුම්පත 2024 අගෝස්තු 30 දින රජයේ ගැසට් පත්‍රයේ පළ කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා සභානායක කාර්යාලය වෙත යොමු කර තිබුණි. මේ අනුව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා වසර 32 ක පමණ ගතවී ඇතත්, නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර ගැනීමට සංවිධානයට නොහැකි වී තිබුණි.	අවසන් කෙටුම්පත් පනත 2024.08.30 වන දින රජයේ ගැසට් පත්‍රයේ පළ කොට නිකුත් කර ඇති අතර එම යෝජිත පනත් කෙටුම්පත ප්‍රකාරව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය පිහිටුවීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා නව අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කොට ආරක්ෂක අමාත්‍ය වරයාගේ අත්සන සඳහා යොමු කොට ඇති බව.	කඩිනමින් පනත සම්මත කරගත යුතුය.
(ආ) රත්නපුර දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා, 30 වසරක බදු පදනම මත රු. 7,965,000 ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවා රත්නපුර නව නගරයේ පිහිටි ඉඩම් කොටසක් මිල දී ගෙන රජයේ ප්‍රතිපාදන රු. 54,327,029 ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිල්ල දින 243 කින් නිම කිරීමට සැලසුම් කර තිබූ නමුත් මෙම කොන්ත්‍රාත්තුව ප්‍රමාද වී නිම කර තිබූ අතර ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. කාර්යාලය භෞතිකව පරීක්ෂාවේ දී ගොඩනැගිල්ලේ පොළවේ බොහෝ ස්ථානවල ටයිටේනියම් කරන ලද කොටස් කැඩී තිබුණ අතර අධික	2020 වසරේ මාර්තු මස සිට පැවති කොවිඩ් වසංගත තත්ත්වය සහ 2022 වසරේදී, ශ්‍රී ලංකාවේ දරුණු ආර්ථික අර්බුදය මෙම ව්‍යාපෘතියේ ප්‍රගතියට අහිතකර ලෙස බලපාන ලදි. මෙම කරුණු සැළකිල්ලට ගෙන කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී ඇති බැවින් ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු නොකරන ලදී. ගොඩනැගිල්ලේ දෝෂ පිළිසකර කිරීමේ කාලය තුළ වාර්තා වූ දෝෂ සියල්ලම නිවැරදි කරන ලදී. එබැවින් රඳවා ගන්නා ලද මුදල නිදහස් කරන ලදී.වර්තමානයේ පවතින අඩුපාඩු, දෝෂ පිළිසකර කිරීමේ කාලයෙන් (Defect Liability Period) පසු ඇතිවූ	සැළසුම් කළ පරිදි ඉදි කිරීම් කටයුතු ප්‍රමිතියට අනුව සිදු කෙරේද යන්න නිසි අධීක්ෂණයක් සිදුකල යුතු අතර ගොඩනැගිල්ලේ දෝෂ පිළිසකර කිරීමේ කාලය තුලදී කොන්ත්‍රාත්කරුගෙන් සිදු කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

වර්ෂාපතනය සමඟ ජලය කාර්යාල පරිශ්‍රය තුළට ගලා ඒම හේතුවෙන් කාර්යාල කටයුතු සිදු කිරීම අපහසු වීමත්, ගොඩනැගිල්ල තුල වතුර කාන්දු වීම හේතුවෙන් බිත්තිවල දියසෙවළ බැඳී ඉහළ මාලයේ බිත්ති පුපුරා ඉරි තැලී තිබූ නමුත් ඒවා අලුත්වැඩියා කර ගැනීමට කටයුතු කිරීමකින් තොරව රඳවා ගන්නා ලද මුදල් නිදහස් කර තිබුණි.	දෝෂ වන අතර එම දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.	
(ඇ) ගොඩනැගිල්ලක් ඉදි කිරීමෙන් පසුව එම ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට පෙර අනුමත සැලසුම් සහ රෙගුලාසි වලට අනුකූල වන බවට අනුකූලතා සහතිකයක් (COC) ලබාගත යුතු වුවද, සංවිධානයේ ප්‍රධාන කාර්යාලයෙහි පිහිටි රු. 767,995,987 ක් වටිනාකම වූ නව ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් පසු අනුකූලතා සහතිකය ලබාගෙන නොතිබුණි.	නව ගොඩනැගිල්ල සඳහා අනුකූලතා සහතිකය ලබා ගැනීමට අදාල කටයුතු සිදුකරමින් පවතී.	අනුකූලතා සහතිකය කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ) අවදානම් සහිත දිස්ත්‍රික්ක 14ක 2024 දෙසැම්බර් 31 දිනට නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීම සඳහා දත්ත ලබාගැනීමට ස්වයංක්‍රීය වර්ෂාමාන 330ක් ස්ථාපිත කර තිබූ අතර එදිනට ස්වයංක්‍රීය වර්ෂාමාන 67ක් අක්‍රීයව පැවතුණි. තවද, ඉහත සක්‍රියව පවතින ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධති 251 ක් අතරින් වර්තමානය වන විට පද්ධති 192 ක දායකත්වය පමණක් ලබාගෙන නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කරන නමුත් අක්‍රීය වර්ෂාමාන 126 සක්‍රීය කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම වර්ෂාමාන බොහොමයක් ස්ථාපිත කර, මේ වන විට වසර 07කට වඩා ගත වී ඇති අතර, ඒවායේ අභ්‍යන්තර ඉලෙක්ට්‍රෝනික උපාංග ක්‍රියාකාරී කාලය ඉකුත් වී ඇත. ඒ අනුව සම්පූර්ණ වශයෙන් අක්‍රිය වර්ෂාමාන අලුත්වැඩියා කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වන බැවින් ඒවා වාර්ෂික නඩත්තු ක්‍රියාවලියට භාජනය නොවේ. මෙම කරුණු සැලකිල්ලට ගෙන, දේශගුණික අව බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය ව්‍යාපෘතිය (CresMPA) යටතේ නායයෑම් පවතින දිස්ත්‍රික්ක 14හි ම ස්ථාපිත කර ඇති සියලුම වර්ෂාමාන ප්‍රතිස්ථාපනය කිරීම සඳහා සැලසුම් කර ඇති අතර එහි ටෙන්ඩරය පිරිනමා මේ වනවිට වර්ෂාමාන 200ක් පමණ ස්ථාපනය කර ඇත. 2025 අගෝස්තු මස 31 වනවිට සියලු වර්ෂාමාණ ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇති බව	ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය නිසියාකාරව නඩත්තු කළ යුතුය.

(ඉ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයෑම් පර්යේෂණ හා ආපදා කළමනාකරණ අංශය (LRRMD) මගින් දිස්ත්‍රික්ක 13 ක වර්ග කිලෝමීටර 32593 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි 1:50000 ක පරිමාණයේ නායයෑම් කලාප සිතියම් ගත කිරීම 2022 වර්ෂයේ නිමකර තිබූ අතර, ප්‍රමුඛතා පදනමක් මත ඉන් වර්ග කිලෝමීටර 25649 ක් සඳහා පමණක් 1:10000 පරිමාණයට සිතියම් ගත කිරීමේ කටයුතු විගණිත දින වන විට වර්ග කිලෝමීටර 10560 ක් ආවරණය වන පරිදි සිදුකර තිබුණි. එය තෝරාගත් මුළු භූමි ප්‍රමාණයට ප්‍රතිශතයක් ලෙස සියයට 41 ක ප්‍රමාණයක් හා පළමු ප්‍රමුඛතා මට්ටම අනුව සියයට 84 ක ප්‍රමාණයක් විය. එම සිතියම් ප්‍රමාණය පදනම් කරගෙන සංවිධානය විසින් නිවාස, වෙළෙඳ, පාසල් හා ආගමික ගොඩනැගිලි 84755 ක් අධි අවදානම් ප්‍රදේශ වල පවතින බව හඳුනාගෙන තිබුණද ප්‍රමුඛතා පදනම මත තෝරාගත් වර්ග කිලෝමීටර 25649 තුලින් වර්ග කිලෝමීටර 15089 ක ප්‍රමාණයක් 1:10000 පරිමාණයට සිතියම්ගත කර නොතිබූ බැවින් එම බිම් ප්‍රමාණය තුල අධි අවදානමක් සහිත ගොඩනැගිලි කොපමණ ප්‍රමාණයක් පවතීද යන්න හඳුනාගෙන නොතිබුණි.	1:10,000 පරිමාණයට නායයෑම් ආපදා කලාප සිතියම් සකස් කිරීමේදී 1:50,000 පරිමාණයේ සිතියම් මෙන් නොව, ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් විශාල දත්ත ප්‍රමාණයක් ලබාගත යුතු අතර, ඒ සඳහා සාපේක්ෂව විශාල පිරිවැයක්, මානව සම්පත් සහ කාලයක් වැය වේ. එබැවින්, පළමු ප්‍රමුඛතාවය ලෙසින් හඳුනාගත් භූමි ප්‍රමාණයෙන් වර්ග කිලෝ මීටර් 10,560 ක් ආවරණය වන පරිදි 1:10,000 පරිමාණයේ සිතියම් මේ වන විට සකස් කොට ඇත. ඉතිරි ප්‍රදේශවලද සිතියම් ඉදිරි වර්ෂවලදී සකස් කිරීම සඳහා සැලසුම් කොට ඇත.	නායයාම් කලාප සිතියම් ගත කිරීම කඩිනම් කර ආපදා අවධානම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ) නායයාම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (Landslide Mitigation Project), ශ්‍රී ලංකා රසායනික අවදානම් ක්‍රමාණුකූලව තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය සහ තාක්ෂණික දායකත්වයෙන් අධි අවදානම් කලාප වල ජීවත්වන පුද්ගලයින් ආරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීමේ වැඩසටහන සහ බදුල්ල සහ කළුතර විද්‍යාගාර පහසුකම් සහිත කාර්යාල ඉදිකිරීම සඳහා ලබා දී තිබුණු රු. 236,767,553 ක් වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා නොයෙදවා 2024 දෙසැම්බර් 31 දින වන විටද ස්ථාවර තැන්පතු වල තැන්පත් කර තිබුණි.	**නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය - ශේෂය රු. මිලියන 134** 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල වන රුපියල් මිලියන 100 ක මුදල සංවිධානය වෙත ලැබුණේ 2024 අගෝස්තු මාසයෙන් පසුවය. එබැවින් සියලු කොන්ත්‍රාත් පිරිනමා කොන්ත්‍රාත් 04 ක වැඩ නිම කර ඇති අතර කොන්ත්‍රාත් 03 ක වැඩ අවසාන අදියරෙහි පවතින බව. **නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය - ශේෂය රු.මිලියන 19** ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් සිදු කරමින් යන නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතියේ තාක්ෂණ සේවා සැපයීම වෙනුවෙන් මෙම මුදල වෙන්කර ඇත. ව්‍යාපෘතියේ	ප්‍රතිපාදන ලබා දුන් කාර්යයන් සැළසුම් කළ අයුරින් ඉටු කිරීමට පියවර ගත යුතුය.

	ක්‍රියාකාරීත්වයේ පවතින මන්දගාමී බව හේතුවෙන් මෙම මුදල වැයවීමේ අඩු ප්‍රගතියක් ඇති බව. **<u>විද්‍යාගාර පහසුකම් සහිත දිස්ත්‍රික් කාර්යාල ඉදි කිරීම - ශේෂය රු.මිලියන 81</u>** දිස්ත්‍රික් කාර්යාල ඉදි කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර නව ගොඩනැගිලි ඉදි කිරීම අත්හිටුවීමට රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය මත දිස්ත්‍රික් කාර්යාල ඉදි කිරීම ප්‍රමාද කිරීමට සිදු වූ බව. **<u>රසායනික අවදානම් තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය - ශේෂය රු.මිලියන 2.4</u>** මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ අවසාන රැස්වීමක් සංවිධානය කර අදාළ නිළධාරින්/ආයතන දැනුවත් කිරීම හා අවශ්‍ය මෙවලම් සහ දත්ත සමුදා රාමු හඳුන්වාදී ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් ඉදිරිපත් කිරීමට සහ නැවත සමාලෝචනය කිරීමට බලාපොරොත්තු වන බව.	
(උ) 2024 වර්ෂය තුළ ඉවත් කළ දේපළ පිරියත හා උපකරණ වල ධාරණ අගය රු.4,030,677ක් වන අතර මෙම වත්කම් ඉවත් කිරීමෙන් සංවිධානයට රු.3,142,182ක පාඩුවක් සිදු වී තිබුණි.	මෙම ඉවත් කළ උපකරණ තුළ වසර 20 කට වඩා පැරණි UT Machine එකක් ඇතුලත් වූ අතර එය සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කමකි. නමුත් 2023 වත්කම් ප්‍රත්‍යාගණනයේදී එය රුපියල් 2,800,000/- කට ප්‍රත්‍යාගණනය කර ඇත. එය යකඩ නොව විනව්වට්ටි වලින් සාදා තිබුණ බැවින් සැලකියයුතු මුදලකට අලෙවි කර ගත නොහැකි විය.	ප්‍රත්‍යාගණනයන් සිදු කිරීමේදී වටිනාකම් නිවැරදිව ගණනය කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේදී කාර්මික සංවර්ධන මණ්ඩලයෙන් රු. 5,000,000ක් වටිනා AC ඩීසල් උත්පාදක යන්ත්‍රයක් (80KV A synchronous) ලැබී තිබුණු අතර එය ක්‍රියාකාරී තත්වයට පත්කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබීම හේතුවෙන් නිශ්කාර්යව පැවතිණි.	මෙම ජෙනරේටර් යන්ත්‍ර අපදා කළමනාකරණ අංශයෙන් ප්‍රදානයක් ලෙස ලැබී ඇති අතර සංවිධානයේ විදුලි සැපයුම් පද්ධතියට සවිකිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.	වත්කම උපයෝජනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංවිධානය සතු ස්ථාවර තැන්පතු වල රු. 674,298,014 ක් ආයෝජනය කර තිබූ නමුත් නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය සඳහා ඉඩමක් මිලදී ගෙන කාර්යාලයක් ඉදි කර ගැනීමට කටයුතු නොකර නුවරඑළියේ කාර්යාලය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු.13,770,000 ක් ගෙවා තිබුණි.	දිස්ත්‍රික් කාර්යාල ඉදි කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර නව ගොඩනැඟිලි ඉදි කිරීම අත්හිටුවීමට රජය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණය මත ඉදි කිරීම ප්‍රමාද කිරීමට සිදු විය. කෙසේ වෙතත්, 2025 වර්ෂය තුළ දිස්ත්‍රික් කාර්යාල 02ක් ඉදි කිරීම හෝ මිළදී ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා මුදල් අමාත්‍යතුමා වෙත යොමු කර ඇති අතර අනුමැතිය ලැබීම මත දිස්ත්‍රික් කාර්යාල ඉදි කිරීම හෝ මිලදී ගැනීම සඳහා කටයුතු කිරීමට සැළසුම් කර ඇත.	අවශ්‍යතාවයන්ට අනුව දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම් කටයුතු කඩිනම් කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බොල්තුඹේ ගම්මානයේ නායයෑම් සහ ගල් පෙරළීම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය කොන්ත්‍රාත්වරයෙකු සමග 2024 පෙබරවාරි 17 දින එළැඹි ගිවිසුමකට අනුව ඉදිකර තිබුණු කාණු 03 ක් භෞතිකව පරීක්ෂා කරන ලදි. එනම් DS(M)-A නැමැති කාණුවේ බිල්පත්‍රයේ වූ මිණුම් වාර්තාවේ කාණුවේ දිග මීටර් 44.5ක් ලෙස සඳහන් වුවත් භෞතිකව එය මීටර්41.5 ක් විය. තවද DS(M)-D කාණුවේ පඩිපෙළ අවසානයේ පතුල කොන්ක්‍රීට් ඝනකම මි.මී.150ක් විය යුතු වුවත් එය මි.මී.90ක් ව පැවති අතර කාණුවේ තිරස් අතට මි.මී. 10 කම්බි 3 යෙදිය යුතු වුවත් කම්බි 2 ක්ද සිරස් අතට මි.මී. 12 කම්බි වෙනුවට මි.මී. 10 කම්බිද යොදා තිබුණි. තවද Y හැඩැති කාණුවේ පතුල මි.මී. 150ක ඝනකමකින් කොන්ක්‍රීට් යෙදිය යුතු වුවත් ස්ථාන 05ක පරීක්ෂාවේදී මි.මී. 50 ක් පමණක් යොදා තිබුණි. තවද කාණු වල දෙපස බැමි වල ලැලි රාමු යෙදවීමකින් තොරව කොන්ක්‍රීට් දමා තිබුණි.	අවසාන බිල්පත සකස් කිරීමේදී මිණුම්දෝරු පරීක්ෂාවක් මත අවශ්‍ය සංශෝධනයන් සිදු කර ගෙවීම් කරනු ලැබේ. කාණු වල පැවති දෝෂ කොන්ත්‍රාත්කරු ලවා නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව.	දෝෂ හා අඩුපාඩු කොන්ත්‍රාත්කරු ලවා නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සංවිධානය විසින් නිසි පරිදි අධීක්ෂණය කළ යුතුය.

කොන්ක්‍රීට් යෙදීමේදීද නියමිත ප්‍රමිතියට අනුව සිදු කර නොමැති බැවින් එහි සවිමත්භාවයක් නොමැති බව නිරීක්ෂණය විය.		

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට සංවිධානයේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් සඳහා පුරප්පාඩු 49 ක් පැවතුණි. මේ අතර අධ්‍යක්ෂ (පාලන) තනතුර සහ අධ්‍යක්ෂ (මානව ජනාවාස සැලසුම් හා පුහුණු) තනතුර 2022 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. තවද, ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරු 04ක් වන ජ්‍යෝෂ්ඨ විද්‍යාඥ, විද්‍යාඥ, කළමනාකරු (තාක්ෂණික / රසායනාගාර) සහ සහකාර අධ්‍යක්ෂ (මුදල්) යන තනතුරුවලද පුරප්පාඩු සංඛ්‍යාව 47 ක් වූ අතර ජ්‍යෝෂ්ඨ විද්‍යාඥ සහ විද්‍යාඥ යන තනතුරුවල පුරප්පාඩු 39 ක් පැවතුණි. ජ්‍යෝෂ්ඨ මට්ටමේ ඉහත තනතුරුවල කාර්යයන් සංවිධානයේ අරමුණු ඉටුකර ගැනීමට ඉමහත් දායකත්වයක් සපයන බැවින් එකී තනතුරු සඳහා බඳවා ගැනීමට ක්‍රියා නොකිරීම සංවිධානයේ කාර්යක්ෂමතාවය කෙරෙහි බලපා තිබුණි.	අනුමැතිය ලැබී ඇති තනතුරු වලින් අධ්‍යක්ෂ (මානව ජනාවාස සැලසුම් හා පුහුණු) තනතුරද, ජ්‍යේෂ්ඨ විද්‍යාඥ තනතුරු 07 ක් ද බඳවා ගැනීමට පියවර ගෙන ඇත. විද්‍යාඥ තනතුරු 26 ක් බඳවා ගැනීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ සමාලෝචන කමිටුවේ අනුමැතිය සඳහා යොමුකර ඇත. අධ්‍යක්ෂ පාලන තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. ඉතිරි පුරප්පාඩු ආයතනයේ අවශ්‍යතාව අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.	සංවිධානයේ කාර්යක්ෂමතාව කෙරෙහි සෘජුවම බලපාන පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය.